චක්‍රලේඛ අංක 11/2010

මගේ අංකය ඩබ්/03/10
බන්ධනාගාර මූලස්ථානය, කොළඹ -9
2010-02-08

සියළුම බන්ධනාගාර අධිකාරීන් / සහකාර අධිකාරීන් වෙත,

## බන්ධනාගාර නේවාසික නර්තන කණ්ඩයම වෙන් කිරීම

1973 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාරයේ ආරම්භ කරණ ලද නේවාසික උඩරට නර්තන කණ්ඩායම පසුව පිළිවෙලින් බෝගම්බර සහ මහර බන්ධනාගාර දක්වා ව්‍යාප්ත කරණ ලදුව දළුපොත තරණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ පහත රට නර්තන කණ්ඩයමක්ද ආරම්භ කර මෙම කණ්ඩායම් මහජන ප්‍රසාදයට ලක් වන අයුරින් සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

සිරකරුවන් නර්තන කණ්ඩායම්හි යෙදවීම සිරකරු පුනරුත්ථාපනයට රුකුලක් මෙන්ම බන්ධනාගාරය සහ සිරකරුවන් පිළිබඳව සමාජය දක්වන ආකල්ප සුභවාදී කිරීමටද හේතු වන බැවින් පහසුකම් ඇති සෙසු බන්ධනාගාර ආයතන වලද නේවාසික නර්තන කණ්ඩායම් ආරම්භ කිරීමට කටයුතු කර ඉදිරි පියවර සඳහා මා අමතන ලෙස දන්වමි.

දැනට බන්ධනාගාර ආයතනයන්හි ක්‍රියාත්මක වන නර්තන කණ්ඩායම් සහ ඉදිරියේදී ආරම්භ කරණ නේවාසික නර්තන කණ්ඩායම් සම්බන්ධව පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීමට සියළුම බන්ධනාගාර අධිකාරීන් කටයුතු කළ යුතුය.

### ( 1 ) බාහිර ඉල්ලීම් වලට අනුව නර්තන කණ්ඩායම් වෙන් කිරීම

1. පෞද්ගලික නිවාස සඳහා නේවාසික නර්තන කණ්ඩායම් වෙන් නොකිරීමට වගබලා ගත යුතු අතර, පොදු ස්ථාන සඳහා පමණක් ඇණවුම් භාර ගැනීමටත්, ඉල්ලුම්කරුවන්ගෙන් ලිඛිත ඉල්ලීම් ලබා ගැනීමටත් කටයුතු කල යුතුය. තවද මේ සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස කල් වේලා ඇතිව අදාල තොරතුරු ඔබේ නිර්දේශයද සමග මා වෙත සැපයිය යුතුය.

11. බාහිරින් මුදල් ගෙවා ප්‍රවාහණ පහසුකම් සැපයීමේ පදනම මත නර්තන කණ්ඩායම් වෙන් කිරීමේ බලය බන්ධනාගාර කොමසාරිස් (සුබසාධක) වෙත පවරා ඇති බැවින් එවන් ඉල්ලීම් බන්ධනාගාර කොමසාරිස් (සුබසාධක) නමින් කල යුතුය.

111. නර්තන කණ්ඩායම ආරක්ෂණය කිරීමේදී පුහුණු කිරීම් කටයුතු බන්ධනාගාර නිලධාරියෙකු විසින් කරන්නේ නම් එම ආරක්ෂණ කටයුතු සඳහා එම නිලධාරී සහභාගී කල යුතුය.

**( 2 ) වර්තමානයට ගැලපෙන ආකාරයෙන් නේවාසික නර්තන කණ්ඩායම් සැපයීම සඳහා වූ ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කරණ අතර මෙම අය කිරීම් 2010-03-01 දින සිට බලපාන පරිදි ක්‍රියාත්මක කල යුතු බව දන්වමි.**

| | | |
|---|---|---|
| 1. | පිළිගැනීමේ හෝ විවාහ මංගල්‍යක් වැනි උත්සවයක් සඳහා එක් එක් ශිල්පියෙකුට අය කිරීම (බෝගම්බර නර්තන කණ්ඩායම හැර) | රු.600.00 |
| | බෝගම්බර නර්තන කණ්ඩායමේ එක් ශිල්පියෙකු සඳහා අය කිරීම | රු.500.00 |
| 11. | රාත්‍රි කාලයේ පැවැත්වෙන කිනම් හෝ පෙරහැරක් හෝ පිරිත් පිංකමක් සඳහා එක් ශිල්පියෙකුට අය කිරීම (බෝගම්බර හැර) | රු.800.00 |
| | බෝගම්බර නර්තන කණ්ඩායමේ එක් ශිල්පියෙකු සඳහා අය කිරීම | රු.700.00 |
| 111. | පැයකට වැඩි සංස්කෘතික සංදර්ශණයක් සඳහා එක් ශිල්පියෙකුට | රු.1000.00 |

(............. 2 ට.

( 3 ) නර්තන කණ්ඩායම් සැපයීම වෙනුවෙන් ලැබෙන මුදල් පහත සඳහන් පරිදි බෙදා වෙන්කර ගිණුම් ගත කිරීම කල යුතුය.

| | | |
|---|---|---|
| 1. | සිරකරු සුබසාධක අරමුදල සඳහා | 40% |
| 11. | ඒකාබද්ධ අරමුදලට | 10% |
| 111. | නැටුම් උපදේශකට | 25% |
| 1v. | නර්තන සඳහා සහභාගී වූ නේවාසිකයින්ට | 25% |

( 4 ) නර්තන ශිල්පීන්ට ගෙවීමට වෙන් කරණ මුදල් ඔවුන් වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුම් විවෘත කර එහි තැන්පත් කර නිදහස්ව යාමේදී එම පොත් ඔබ ඉදිරියේදී භාර දීමට කටයුතු කල යුතු අතර අදාල විස්තර බන්ධනාගාර කොමසාරස් (සුබසාධක) වෙත සැපයිය යුතුය.

( 5 ) නර්තන උපදේශකට නියමිත ගෙවීම් නිසි පරිදි මාසිකව ගෙවා එම වවුචරයේ/ රිස්විෂන් පත්‍රයේ පිටපතක් මා වෙත සැපයිය යුතුය.

( 6 ) නර්තන කණ්ඩායම සඳහා මුදල් ගෙවීමෙන් පසුව ඉල්ලුම්කරුගේ අවශ්‍යතාවයක් මත මෙය අවලංගු කල අවස්ථාවකදී ඒ සඳහා වෙනත් දිනයක් ලබාදීමට මගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කල යුතුය. ගෙවූ මුදල් ආපසු ලබා ගැනීමට ඉල්ලුම් කල හොත් සම්පූර්ණ මුදලින් අඩක් පමණක් ගැනුම් කරුට ගෙවීම සඳහා මගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කල යුතුය.

( 7 ) වැලිකඩ සහ බෝගම්බර නර්තන කණ්ඩායම් වැඩ අංශ ලෙස දැනට පවත්වාගෙන යන බැවින් මහර නර්තන කණ්ඩායම සඳහාද එපරිදි කටයුතු කිරීම අනුමත කරමි.

( 8 ) නර්තන කණ්ඩායම් අලුතෙන් ආරම්භ කිරීමේදී සහ නර්තන කණ්ඩායම් අවශ්‍යතා සඳහා සිරකරු සුබසාධක අරමුදලින් ප්‍රතිපාදන වෙන්කර දිය හැකි බැවින් වාර්ෂික ඇස්තමේන්තුවට මේවා ඇතුලත් කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්තීන්ට අනුව අදාල ඉල්ලීම් කර ඉදිරි කටයුතු යුතුය.

මේ පිළිබඳ අදාල තොරතුරු වෙතොත් බන්ධනාගාර කොමසාරිස් (සුබසාධක) අමතන්න.

වී.ආර්. සිල්වා (ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී)
මේජර් ජනරාල්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.